## එළවළු හා පලතුරු සඳහා ප්‍රමිතියක් අවශ්‍ය ඇයි?

එළවළු හා පලතුරු වල නැවුම් බව වෙළඳපොළ රාක්කය මතදී පමණක් ආරක්ෂා වියයුත්තක් නොව, ගොවිපළ නිෂ්පාදනයේ සිට පරිභෝජනය දක්වාම ආරක්ෂා කළයුත්තකි. අප මිලදී ගන්නා එළවළු හා පලතුරු කිසිදු නියාමනයකින් තොරව, අධික ලෙස කෘෂි රසායන වැනි බාහිර යෙදවුම් භාවිතයෙන් නිෂ්පාදිත විය හැකි විමත්, අපිරිසිදු පසු අස්වනු සැකසුම් හේතුවෙන් විවිධ බාහිර අපද්‍රව්‍ය සමග ස්පර්ශිත බැවින් ඒවා භාවිතයෙන් බොහෝ පිරිස් සෘජු හා වක්‍ර ලෙස සෞඛ්‍ය තර්ජනයන්ට ලක්විමත් සිදුවේ. මෙම තත්ත්වය තුල පාරිභෝගික අප මිල දී ගන්නා නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය හා සෞඛ්‍ය ආරක්ෂිත බව සඳහා ප්‍රමිතිකරණයක් හා විශ්වාසනීයත්වයක් ලබාගැනීමේ අවශ්‍යතාවයක් මතුව ඇත.

## ප්‍රමිතිකරණයක් හඳුන්වා දීම

ඉහත අවශ්‍යතාවය හඳුනාගත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නැවුම් එළවළු හා පලතුරු සඳහා ප්‍රමිතිකරණ සහතිකයක් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව SLS 1523 ප්‍රමිතිකරණය යටතේ යහපත් කෘෂි පිළිවෙත් (Good Agricultural Practices - GAP) පියවරයන්ට අනුකූලව නිෂ්පාදනය කරන එළවළු හා පලතුරු සඳහා SL-GAP සහතිකය නිකුත් කරනු ලැබේ. මෙමගින් පාරිභෝගික ඔබ අතට පත්වන එළවළු හා පලතුරු වල ප්‍රමිතිය සහතික වන අතර විශ්වාසනීයත්වය සුරැකේ.



## SL-GAP නිෂ්පාදන යනු මොනවාද?

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ SL-GAP ප්‍රවර්ධන ඒකකයේ අධීක්ෂණයෙන් කෘෂි යෙදවුම් වලට අදාලව නිර්දේශ අනුගමනය කරමින් තිරසර බවින්, පරිසර හිතකාමිව, සමාජ පිළිගැනීමක් සහිතව, බාහිර අපද්‍රව්‍යන්ගෙන් තොරව ගුණාත්මක හා සෞඛ්‍යාරක්ෂිතව එළවළු හා පලතුරු නිෂ්පාදනය කර එම නිෂ්පාදනයන් අදාළ පිරිවිතරයන්ට අනුකූලව නිපදවා ඇතිබවට SL-GAP සහතිකකරණ ඒකකයෙන් සහතික කිරීමෙන් අනතුරුව වෙළඳපොළ වෙත නිකුත්කරන ලද නිෂ්පාදනයන් වේ.



## SL-GAP නිෂ්පාදන පරිභෝජනය තුළින් අපහට අත්වන වාසි මොනවාද?

- විශ්වාසනීය අයුරින් ගුණාත්මකව හා සෞඛ්‍ය ආරක්ෂිතව නිපදවූ එළවළු පලතුරු වැනි කෘෂි නිෂ්පාදන භාවිතයෙන්, කෘෂි නිෂ්පාදනයන්ගෙන් ඇතිවිය හැකි සෞඛ්‍යමය අවදානම අවමවීම.
- කෘෂි රසායන අවශේෂයන්ගෙන් තොර ආහාර භාවිතය තුළ නීරෝගිමත් අනාගත දරු පරපුරක් බිහිවීම.
- සමාජ පිළිගැනීමකින් යුතු පරිසර හිතකාමී පරිභෝජනයක් තුළින් ආත්මාභිමානයක් ලබා ගත හැකිවීම.

## සහතිකකරණ ලද SL-GAP නිෂ්පාදන හඳුනාගන්නේ කෙසේද?

සෑම සහතිකකරණ ලද නිෂ්පාදන ඒකකයක්ම SL-GAP ප්‍රවර්ධන ඒකකයේ නිළධාරියකුගේ අධීක්ෂණය යටතේ ඇසුරුම් කිරීම සිදුකරන අතර සෑම ඇසුරුමක් සඳහාම SL-GAP ලාංඡනය හා අනුරේඛිත කේතනයක් (QR Code) සහිත ස්ටිකරයක් හෝ ලේබලයක් යොදනු ලැබේ. එමගින් නිෂ්පාදනය පිළිබඳ සියලු තොරතුරු ලබාගත හැකි අතර ඔබගේ ස්මාර්ට් ජංගම දුරකථනයෙන් QR Code reader යෙදවුම (Mobile Phone App) මගින් නිෂ්පාදිත ගොවිපලේ සිට සියලු ක්‍රියාදාමයන් ඇතුළත් අදාල තොරතුරු ක්ෂණයකින් ඔබවෙත ලබාගත හැක.






## GAP නිෂ්පාදන ලබා ගත හැකි ස්ථාන

සහතිකකරණය ලැබූ ගොවිපළ එළවළු හා පලතුරු පාරිභෝගිකයන් වෙතට පත් කිරීම අරමුණු කොට ගෙන, තෝරාගත් සුපිරි වෙළඳසැල් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් ස්ථාපිත විශේෂිත GAP නිෂ්පාදන අලෙවි සැල් ජාලයක් මගින් SL - GAP සන්නාමය සහිතව විශ්වාසනීය ලෙස සැපයීම් කටයුතු කිරීමට සැලසුම් කරමින් පවතී.

වැඩි විස්තර හා උපදෙස් සඳහා
SL - GAP සහතිකකරණ ඒකකය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
දුරකථන : 081-206 8081
slgapcertification@ gmail.com

සැකසුම
ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව

මුද්‍රණය
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නෝරුව



# නිරෝගිමත් පරපුරක් සඳහා සෞඛ්‍යාරක්ෂිත එළවළු, පලතුරු



SL - GAP සහතිකකරන ඒකකය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය